


# මහ සතර සිහිවටන

## ගී පෙරැළිය

අරිසෙන් අහුබුදු

# මහ සතර සිහිවටන

## (මහා සතිපට්ඨාන සූත්‍රය)

## ගී පෙරැළිය

**අරීසෙන් අහුබුදුවන් විසින්**

**සිංහළයට පෙරැළිණි**

ගත්කරු පළ කැරුමෙකි

# මහ සතර සිහිවටන

**(මහා සතිපට්ඨාන සූත්‍රය)**

**ගී පෙරැළිය**

© අරීසෙන් අහුබුදු
හිමි කම් ඇවිරිණි

ISBN

බොරලැස්ගමුවේ, රත්තණපිටියේ, පාසල් මාවතේ,
109/1/1,
පොලයිටි පහරුවෙහි පැහැරැවිණි

වසුන් පිටු නිමැවුම
රෙක්ස් හැමිල්ටන්

ගත්කරු පළ කැරුමෙකි

# ඇරියුම

*'' දෙ දහසින් පන්සියේ<br>
පනස් වැනි බුදු මඟුල<br>
නිමිති කොටැ...<br>
මහ සතර සිහිවටන්<br>
සුතුර පෙළ බසින් එන<br>
සරල හෙළ පැදි බසින<br>
ලො වැඩ වෙයි කළ හොතින..<br>
මෙ ඇරියුම එ දම්දස්<br>
මැතිඳුන් ගෙ මැ බසින්<br>
තව ද වෙසතුරු කෙනකු<br>
සදිසි කරු හිනැටිගල<br>
නිවෙසැ දී මා හමු වැ<br>
කලා ලොවැ සරා සඳ<br>
එදිරිසිහ සතිස්සඳ<br>
සකිඳු කළ ඇරියුමෙන්<br>
මෙ කව ලියැවුණු වග යි...*

**-අරීසෙන් අහුබුදු**

# පබඳු වදන

**මහ සතර සිහිවටන - ගී පෙරැළිය** නමින් පළ වන මෙ පොතෙහි අත් පිටපත බු.ව. 2550 වෙසක් අව අට වක් දින දහසක් බුදුන් බුදු වන අලුයමැ අනුරපුරැ රුවන්මැලි සෑ රදුන් අබියසැ දෙව් ඇරියුමෙන් අනතුරු වැ ගැයීම ඇරැඹුවෙමු. මෙහි අපි නමින් සැඳැහෙන්නෝ ම පියඹ සඳා, දුව සමන්තී, මුනුපුරු මනු ද, මෙ වරැ දෙ දහස් පන්සිය පනස් වන බුදු මඟුලට  රන්වැලි සෑ රදුන් සුනු පිරියමින් පුද කළ, වෙදදුරු ජයනාත් අබාවිකුම් සූරීන් හා ඔවුන් සතු රන්කෙම වෙද විදුහලෙහි සිසුවෝ ද, හෙළ හවුලේ සකසුරු ශ්‍රීනාත් ගණේවත්ත සූරීහු ද අප ගේ සක්විති රාවන නළුයෙහි විබිසන වත දිවමන් කරන රන්ජිත් පද්මසිරි කලා කරුවාණෝ ද වෙති.

''සව් සක්වළ වෙසෙන්නා වූ - රැස් වෙත් වා, දෙවියෝ මෙ තන්<br>
සග මොක් සුව සදන්නා වූ - දම්රදුන් දම් සවන් සදවූ''

මෙ සේ දෙව් ඇරියුම කළ අපි තුන් වරක් සාදු කාර දුනුමු.
අප ගේ සාදු නද නවතිත් ම එ ම සාදු නද තෙ වරක් මැ ගුවනේ ද රැවු පිළිරැවු විසින් මා සවනැ හිණි.

''දෙව් හඬ අසනට අප කළ පින් මදි'' නොවන බව පළ කරමින් ගුවනින් නැගුණේ දෙවියන් ගේ සාදු නද බවත් ඒ පෙළහරක් බවත් මට නම් පැහැදිලි යි.
මෙ වන් පෙළහරක් මුලින් මැ ඇසුයේ දුටුයේ පෙම්දස් රණසිහ ජනපතිඳුන්

ගේ ඇරියුමෙන් මියුගුණු (මහියංගණ) ගම් උදා උලෙළෙහි බුදුගයා ධම්මික සෑ රදුන් අනුරුවින් ඉදි කැරැවුණු නව මියුගුණු සෑයේ දා නිදහන මා අතින් මැ සිදු කළ දා යැ.

මෙ පෙළහර විතර නුවන්සිරි ජයකුරුවන් ලියූ ''හොබවන තුනුරුවන හෙළ මහ පඬි රුවන පොතින් දන්නේ යි.

දෙව් සාදු නදින් උඩ බැලුණු මා දුටුයේ වලා ඉණි මඟෙකි. රන්මැලි සෑ රදුන් කොත් කැරැල්ල දෙසට රිදී රේකාවක් මෙන් කෙළින් මැ වැටී තිබූ වලා රැස් දහරෙකි.

සතර සිහිවටන් ගී පෙළ සිරිනාත් ගණේවත්තයන් ගයත් ම අපි අනුගැයුම කෙළෙමු.

කල් ඉක්මැ ගිය බව නො දැනිණි. එයට හෙය හිරු රැස මුවහ කළ වලා වියන හා සිඳු වෙරළෙහි අප උන් අයුරු පළ කෙරෙමින් නොකඩ වැ ගලා ආ සිසිල් සුළං දහරාව යි.

අප ගේ පිරිත් හඬ කෙමෙන් වැඩි වන බව දැනී මඳක් හැරී බැලූ මා දුටුයේ අප අනුවැ මැ ගයන තව ද උවසු-උවැසි පිරිසෙකි.

ගැයීම සමහර වත් මැ එක් උවැසියක් අප වෙත විත් ඒ තැනට ඉතා මැ ඇවැසි පොත **සෙත් සයුර** අප'තට දුනු.

දෙව් හිඟිය අනුවැ මෙන් ලද **සෙත් සයුර** තුටින් ඉපිල අතට ගත් වෙදදුරු ජයනාත් අබාවික්‍රම් සූරීහු පින් දීම ඉතා මැනැවින් කළ හ.

අප දුන් මහ සාදු නදෙහි රැවු පිළිරැවු මෙන් ගුවනින් දෙව් නදෙහි සාදු නද ද සවන් සදන පින මම නම් යළි දු ලදිමි.

මා දිවියෙහි ලද ඉහළ මැ තොස කවරේ දැ යි යමකු මගෙන් ඇසුව හොත් මා ඔහුට ඉඳුරා මැ දෙන පිළිතුර නම් **මහ සතර සිහිවටන ගී පෙරැළිය** රන්මැලි සෑ බිමෙහි කියවද්දී මා ලද නිරාමිස තොස මැ බව යි.

මෙ පොත පළ කැරුමෙහි වෙසතුරු අත වූ, නවලෝක වියපුරුව හිමි, එච්.කේ. ධර්මදාස මැතිඳුන් හට ද, මට මෙ කවෙහි දිරි අත වුණු, මෙහි සරල සිංහළ පෙරැළිය ද කළ හෙළ හවුලෙහි ද සකසුරු ශ්‍රීනාත් ගණේවත්ත සූරීනට ද, රූ සටහනින් මෙ පොත සැරැසූ රෙක්ස් හැමිල්ටන් සිත්තරාණන් හට ද මෙ පොත පහරුවම රුවට කළ බොරලැස්ගමුවේ 'පොලයිට්' මුද්‍රණාලයය හිමි නලින් ආශුතෝෂයනට ද මා නොවක් පින හිමි යැ.

බු.ව. 2550 දුරුතු පුර 15
ගල්කිස්ස කලාපුර
140/40 දී යැ.

**- අරීසෙන් අහුබුදු**

## මහ සතර සිහිවටන

### ගී පෙරැළිය

*'' ඇසූයෙමි මෙ සේ මම්*
*සැසි සිරි මුවින් තුම්''*
*අනඳ හිමි දෙසූ සේ*
*සිහිවටන් සුතුර මේ*

තව ද එක් සමයෙක්හි සැසි බුදු පියාණන් කුරු රටෙහි කමස්දම් නියම් ගමැ වෙසෙන්නේ.

''මහණෙනි'' යි සඟ පිරිස් ඇමැතූ සඳ බුදු රදුන් ''බුදු පියාණෙනි'' යි පිළිවදන් දුන් එ සව්වෝ.

''මහණෙනී, සතන් සිත් පිරිසුදුව සඳහා ද සෝ වලප ඉක්මවනු සඳහා ද නය මඟට[1] පැමිණීම සඳහා ද මොක් පසක් කොටගැනුම සඳහා ද එක් ම එක් මගෙක් වෙයි, සතර සීවටන් නම්. එ ම සතර කවරේ ද, මහණෙනී, මහණ තෙමෙ (කෙලෙසුන් ද ) තවන්නේ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ ලොව (හෙවත් කය) කෙරෙහි දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

(කෙලෙසුන් ද) තවන්නේ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ ලොව (හෙවත් විඳුම[2]) ගැන දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ විඳුමන්හි එ ම විඳුම දැකදැක ම වෙසෙන්නේ.

1. අරි අටඟි මඟ (ආර්ය අෂ්ටාංගික මාර්ගය)

2. වේදනාව



(කෙලෙසුන් ද ) තවන්නේ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ ලොව (හෙවත් සිත) කෙරෙහි දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ සිතෙහි සිත අනුව දක වෙසෙන්නේ.

(කෙලෙසුන් ද) තවන්නේ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ ලොව (හෙවත් දම්[1]) කෙරෙහි දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ දහමැ දහම'නුව දක වෙසෙන්නේ.

*මහ දාගබට පෙරැ*
*සිගිති මාදිළි සැයෙ'වි*
*මතු විතැරෙන සිහිවටන*
*සැකෙවින් දැක්වුණු සැටි යි.*



1. ධර්මය

# කය අනුදක්නා සිහිවටන

## අස්වස් පස්වස් පුරුක

මහණෙනී, මහණ තෙමෙ කෙසේ නම් කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ අරම් බිම් ගියේ හෝ රුක් මුලට ගියේ හෝ පාළු ගෙට ගියේ හෝ පලක් බැඳ වාඩි වී කය කෙළින් තබාගෙන, ඉදිරිය ම බලාගෙන, සිහිය පිහිටුවාගෙන හුස්ම ඇතුළට ගැන්ම සිහියෙන් ම කරන්නේ, හුස්ම පිට කිරීම ද සිහියෙන් ම කරන්නේ.

දිගු හුස්ම අදින්නේ දිගු හුස්ම අදිමි යැ යි මනා ලෙස දන්නේ යැ, දිගු හුස්ම හෙළන්නේ දිගු හුස්ම හෙළමි යැ යි මනා ලෙස දන්නේ යැ, කෙටි හුස්ම අදින්නේ කෙටි හුස්ම අදිමි යැ යි මනා ලෙස දන්නේ යැ, කෙටි හුස්ම හෙළන්නේ කෙටි හුස්ම හෙළමි යැ යි මනා ලෙස දන්නේ යැ.

හැම ලෙසින් හුස්ම ඇදුම ද හොඳින් දැනැ හුස්ම අදිමි යැ යි කියා හික්මෙන්නේ යැ. හැම ලෙසින් හුස්ම හෙළුම ද හොඳින් දැනැ හුස්ම හෙළමි යැ යි කියා හික්මෙන්නේ යැ. හුස්ම ඇදුමැ යි කියන කය සකර[1] සන්හිඳුවමින් හුස්ම ඇදුමැ හික්මෙන්නේ යැ, හුස්ම හෙළුමැ යි කියන කය සකර සන්හිඳුවමින් හුස්ම හෙළුමැ හික්මෙන්නේ යැ.

තව ද, මහණෙනි, සමත් ලියන වඩුවෙක්, ඔහු ගෙ ගෝළයෙක් හෝ (ලීය) දිගු වැ ලියනුයෙ දිගු වැ ලියමි යැ යි මනා ලෙස දන්නේ ද, කෙටි වැ ලියනුයෙ කෙටි වැ ලියමි යැ යි මනා ලෙස දන්නේ ද, අන්න එ පරිද්දෙන් මැ මහණ තෙමෙ දිගු හුස්ම අදින්නේ දිගු හුස්ම අදිමි යැ යි මනා ලෙස දන්නේ යැ, දිගු හුස්ම හෙළන්නේ දිගු හුස්ම හෙළමි යැ යි



1. කාය සංස්කාරය (කය සකස් වීම)

මනා ලෙස දන්නේ යැ. කෙටි හුස්ම අදින්නේ කෙටි හුස්ම අදිමි යැ යි මනා ලෙස දන්නේ යැ. කෙටි හුස්ම හෙළන්නේ කෙටි හුස්ම හෙළමි යැ යි මනා ලෙස දන්නේ යැ.

හැම ලෙසින් හුස්ම ඇදුම මැ හොඳින් දන්නේ ද හුස්ම අදිනෙමි යි හික්මෙන්නේ යැ. හැම ලෙසින් හුස්ම හෙළුම මැ හොඳින් දන්නේ ද හුස්ම හෙළනෙමි යි හික්මෙන්නේ යැ. හුස්ම ඇදුමැ යි කියන කය සකර සන්හිඳුවමින් සියලු ලෙස හුස්ම ඇදුමැ හික්මෙන්නේ යැ. හුස්ම හෙළුමැ යි කියන කය සකර සන්හිඳුවමින් සියලු ලෙස හුස්ම හෙළුමැ හික්මෙන්නේ යැ.

මෙ විලසින් තම කයෙහි[1] කය අනුව දක වෙසේ, මෙ විලසින් අනුන් කයැ[1] කය අනුව දක වෙසේ, තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි[1] කය අනුව දක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක වෙසෙයි. ඇති වීම, නැති වීම දහම'නුව (එ) කය දැක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා ම වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ[2] කිසි දෙයෙක) නොඇසුරු[3] වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත්[4] විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*
*කය'නුදක්නා හා බැඳි*
*අස්වස් පස්වස් සිහි*
*පුරුක මෙ තෙකින් නිමියේ.*

---

1. ආශ්වාස - ප්‍රාශ්වාස කායය (හුස්ම ගැනීම)
2. තෘෂ්ණා හෝ දෘෂ්ටි හෝ වශයෙන්
3. ඇසුරු නො කොටැ
4. ආත්ම

# ඉරියවු පුරුක

නැවැත මහණෙනි, මහණ තෙමේ යන කල්හි (මම්) යන්නෙමි යි මනා ලෙස දැනගනී, සිටි කල්හි සිටියෙමි යි මනා ලෙස දැනගනී, නිඳන කලැ, නිඳනෙමි යි මනා ලෙස දැනගනී. යම් අයුරු තමා කය පිහිටියේ වේ ද හේ එ සැටියෙන් මනා ලෙස දැනගනී.

මෙ විලසින් තම කයෙහි[1] කය අනුව දක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ[1] කය අනුව දක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි[1] කය අනුව දක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දකැ වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක වෙසෙයි. ඇති වීම, නැති වීම දහම'නුව (එ) කය දක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා ම වෙයි. (ඇලීමක් දිටුවක් සෙ[2] කිසි දෙයෙක) නොඇසුරු[3] වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත්[4] විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*
*කය'නුදක්නා හා බැඳි*
*ඉරියවු දක්වාලන*
*පුරුක මෙ තෙකින් නිමියේ.*

---

1. ආශ්වාස - ප්‍රාශ්වාස කායය
2. තෘෂ්ණා හෝ දෘෂ්ටි හෝ වශයෙන්
3. ඇසුරු නො කොටැ
4. ආත්ම



# සිවු සපදන් පුරුක

නැවැත, මහණෙනි, මහණ තෙමෙ පෙරට පා නැගුමෙහි ද යළි හැරී ඒමෙහි ද මනා ලෙස දැනගෙන ම වෙසෙන්නේ, ඉදිරිපස බැලුමෙහි ද (අනුදිසා) බැලුමෙහි ද මනා ලෙස දැනගෙන මැ වෙසෙන්නේ, අත්පාහි හැකිළැවුමැ දිග හැරුමැ මනා ලෙස දැනගෙන මැ වෙසෙන්නේ. අහර පැන් ගැනීමෙහි, රස විඳීමෙහි ද ඒ, මනා ලෙස දැනගෙන මැ වෙසෙන්නේ, පහ කැරුමැ මල මූ ද මනා ලෙස දැනගෙන මැ වෙසෙන්නේ, ගමනෙහි ද සිටීමෙහි, හිඳීමෙහි, නිඳීමෙහි, නිඳි වරාලීමෙහි ද බිණීමෙහි, නොබිණුමෙහි මනා ලෙස දැනගෙන මැ වෙසෙන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දක වෙසෙයි. මෙ විලසින් අනුන් කයැ කය අනුව දැක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක වෙසෙයි. ඇති වීම, නැති වීම දහම'නුව (එ) කය දක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ, එය මනා සිහි නුවණ වැඩුම් සඳහා ම වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

සතර සිහිවටනැ
කය`නුදක්නා නම් වන
පළමු සිහිවටනැ එන
සිවු සපදන් පුරුැක නිමි.

# පිළිකුල් මනසිකර පුරුැක

නැවැත මහණෙනි, මහණ තෙමෙ පයින් උඩැ කෙසින් යටැ සමින් අවසන් වැ ඇති, නොයෙක`යුරු අපිරිසුදු දෑ පිරුණු මේ සිරුර මේ ලෙසින් විමසමින් බලන්නේ.

මේ කයෙහි කෙස්, රොම් ද නිය ද, දත්, සම ද, මස්, නහර, ඇට, ඇටමිඳුළු, වකුගඩුව, හදමස ද අක්මාව, දළබුව ද ඇළදිව ද, පෙණහැලි ද, බඩවැල ද, අතුණු, නොපැසුණු අහර, අහිතු[1], පිත, සෙම, සැරව, රිහිර, ඩාදිය, මේද තෙල්, කඳුළු, වසා තෙල්, කෙළ ද සොටු, සඳ මිඳුළු, බඩ දියර[2] තිබෙන්නේ.

මහණෙනී, දෙ පසින් මැ බැඳදූමුණු නොයෙක් ඇට වග එ නම්, හැල් ද, වී හා මුං ද, මෑ ද තල, සහල් හා පිරුණු මල්ලක් ළිහා නුවන් ඇති තැනැත්තෙක් මේ හැල් යැ, මේ වී යැ, මේ මුං යැ, මේ මෑ යැ, මේ සහල් යැ යි නැණින් විමසමින් බලන්නේ යම් සේ ද.

මහණෙනී, එ ලෙසින් මැ මහණ තෙමෙ පයින් උඩ, කෙසින් යට සමින් අවසන් වැ ඇති, නොයෙක`යුරු අපිරිසුදු දෑ පිරුණු මේ සිරුර මේ ලෙසින් විමසමින් බලන්නේ.

මේ කයෙහි  කෙස්, රොම් ද නිය ද දත් , සම ද මස්, නහර, ඇට, ඇට මිඳුළු වකුගඩුව හදමස ද, අක්මාව, දළබුව ද ඇළදිව ද, පෙණහැලි ද බඩවැල ද, අතුණු, නොපැසුණු අහර, අහිතු, පිත, සෙම, සැරව, රිහිර, ඩාදිය, මේද තෙල්, කඳුළු, වසා තෙල්, කෙළ ද සොටු, සඳමිඳුළු, බඩ දියර තිබෙන්නේ.

---

1. අසූචි
2. මූත්‍රා

මෙ විලසින් තම කයෙහි කය අනුව දක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දකැ වෙසෙයි, තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක වෙසෙයි. ඇති වීම, නැති වීම දහම'නුව (එ) කය දක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා ම වෙයි (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*
*කයනු'දක්නා හා බැඳි*
*එ පිළිකුල් මනසිකර*
*පුරුක මෙ තෙකින් නිමියේ.*



# දා මනසිකර පුරුක

නැවැත මහණෙනි, මහණ තෙමේ සිටි පරිද්දෙන්, පිහිටැවූ පරිද්දෙන් 'මේ කයෙහි දැඩි දා[1] ද, දිය දා[2] ද, තෙද දා[3] ද වා දා[4] ද ඇතැ'යි දා විසින්[5] ගෙන මේ සිරුර විමසමින් බලන්නේ.

තව ද මහණෙනි, සමත් ගොන් මරන්නකු නො හෙත් ඔහු ගෙ ගෝළයකු හෝ ගව දෙනක මරා මස් කොටස් විසිනුදු බෙදා සතර මං සන්දියෙකැ තබාගෙන සිටින්නේ යම් සේ ද එ සේ මෙ මහණ තෙමේ 'මේ කයෙහි දැඩි දා[1] ද දිය දා[2] ද තෙද දා[3] ද වා දා[4] ද ඇතැ'යි දා විසින්[5] ගෙන මේ සිරුර විමසමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දක වෙසෙයි. මෙ විලසින් අනුන් කයැ කය අනුව දක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම'නුව (එ) කය දක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි

---

1. පඨවි ධාතු (තද කොටස්)
2. ආපෝ ධාතු (දියර කොටස්)
3. තේජෝ ධාතු (උෂ්ණ කොටස්)
4. වායෝ ධාතු (වායුමය කොටස්)
5. ධාතු වශයෙන්

දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*
*කයනු'දක්නා හා බැඳි*
*දා මනසිකර [1] නමැති*
*පුරුැක මෙ තෙකින් නිමියේ.*

1. ධාතු මනසිකාර



# නව සොහොන් පුරුැක

නැවැත මහණෙනි, මහණ තෙමේ අමු සොහොනැ ලූ, දින එකක්, දෙකක් හෝ තුනක් හෝ ගෙවීගිය, ඉදිමී නිල්වන් වැ ගිය සැරව පිරි කයක් දක්නේ වේ ද, මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වන සුලු වේ යැ. එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දැක වෙසෙයි. මෙ විලසින් අනුන් කයැ කය අනුව දැක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දැක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දැක වෙසෙයි. ඇති වීම, නැති වීම දහම'නුව (එ) කය දැක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ, ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමේ අමු සොහොනැ ලූ කවුඩුවන් විසින් හෝ කනු ලබන, උකුස්සන් විසින් හෝ කනු ලබන, ගිජු ලිහිණියන් විසින්, බලු-සිවල්-විවිද සත් පණුවනුදු විසින් හෝ කනු ලබන කයක් දක්නේ වේ ද, මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වන සුලු වේ යැ, එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දැක වෙසෙයි. මෙ විලසින්

අනුන් කයැ කය අනුව දක්‍ක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි, නැති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි, ඇති වීම නැති වීම දහම්'නුව (එ) කය දක්‍ක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ, එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමේ, ලේ මස් සහිත, නහර වැල් බැඳීගිය, අමු සොහොනැ දමාලූ කයක් දක්නේ වේ ද මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වනසුලු වේ යැ, එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දක්‍ක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දක්‍ක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම්'නුව (එ) කය දක්‍ක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමෙ මසින් තොර ලෙයින් වැකි නහර වැල් බැඳීගිය ඇට සැකිල්ලක් වැ සොහොනෙහි දමාපියන ලද කයක් දක්නේ වේද, මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වනසුලු වේ යැ, එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දක්‍ක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දක්‍ක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම්'නුව (එ) කය දක්‍ක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමෙ මසින් තොර ලෙයින් තොර, බැඳුණු එ නහර වැලින් ඇටසැකිල්ලක් වැ ගිය අමු සොහොනැ දමාලූ කයක් දක්නේ වේ ද, මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ. එ බඳු වන සුලු වේ යැ. එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දක්‍ක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දක්‍ක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක්‍ක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම්'නුව (එ) කය දක්‍ක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක්‍ක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමෙ නහර වැල් බැඳුම් නැති එක්

දෙසෙක අත් ඇට ද එක් දෙසෙක පා ඇට ද එක් දෙසෙක ගොප් ඇට ද දෙසෙක කෙංඩා ඇට ද දෙසෙක කළවා ඇට ද එක් දෙසෙක ඉඟ ඇට ද දෙසෙක පිටකටු ද එක් දෙසෙක කඳ ඇට ද එක් දෙසෙක හනු ඇට ද එක් දෙසෙක දත් ඇට ද එක් දෙසෙක හිස් කබල යන ලෙසින් සියලු අත විසිරගිය ඇට ගොඩක් වූ කයක් දක්නේ ද මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වන සුලු වේ යැ, එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දැක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දැක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දැක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දැක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම්'නුව (එ) කය දැක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමේ හක් පැහැය ඇති සුදු වැ ගිය ඇට ගොඩක් වූ කයක් සොහොනැ දක්නේ වේ ද මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වන සුලු වේ යැ, එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දැක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දැක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දැක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දැක වෙසෙයි, ඇති වීම නැති වීම දහම්'නුව (එ) කය දැක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නො ඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමේ අමු සොහොනැ ලූ වසක් ඉක්මීගොසින් තැනින් තැනැ ගොඩ ගැසුණු ඇට ගොඩක් වූ සිරුර දක්නේ ද මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වන සුලු වේ යැ, එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දැක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දැක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දැක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දැක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම්'නුව (එ) කය දැක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

නැවැත මහණෙනි, මහණ තෙමෙ සොහොනැ ලන ලදුවැ කුණු වැ ගිය සුනු වැ ගිය ඇට සුනු ම රැසක් වූ කයක් දක්නේ වේ ද මෙ මා කය එ මැ සොබා ඇත්තේ යැ, එ බඳු වන සුලු වේ යැ, එ බඳු ගති ඉක්මවන්නේ නැතැ යි තම කය ද එ කය හා සසඳමින් බලන්නේ.

මෙ විලසින් තම කයෙහි කය අනුව දැක වෙසෙයි, මෙ විලසින් අනුන් කයැ කය අනුව දැක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද කයෙහි කය අනුව දැක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව කය දක වෙසෙයි. නැති වීම යන දහම අනුව කය දක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම්’නුව (එ) කය දක වෙසෙන්නේ.

මෙ විලසින් කයෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ කයෙහි කය අනුව දක වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*
*කය’නුදක්නා හා බැඳි*
*මළ සිරුර නවයුරිනි*
*දක්වන පුරුක නිමියේ.*

***මහ සතර සිහිවටන් සුතුරෙ එන***
***කය’නුදක්නා නමැති පළමු වග නිමි වග යි.***



# විඳුමනුදක්නා සිහිවටන

නැවැත මහණෙනි, මහණ තෙමෙ කෙසේ නම් විඳුමන්හි[1] විඳුමනුව[2] දක වෙසේ?

මහණෙනි, මෙ (සස්නෙහි මහණ තෙමෙ) සුව විඳුම් විඳින්නේ සුව විඳුම් විඳිමි යැ යි මනා ලෙස දන්නේ යැ, දුක් විඳුම් විඳින්නේ දුක් විඳුම් විඳිමි යැ යි මනා ලෙස දන්නේ ය, දුක් ද නැති සුව ද නැති විඳුමන් ද විඳින්නේ, දුක් ද නැති සුව ද නැති විඳුමන් ද විඳිමි යැ යි, මනා ලෙස දන්නේ යැ.

කැමි සමුසු[3] සුව විඳුම් විඳින්නේ කැමි සමුසු සුව විඳුම් විඳිමි යැ යි, මනා ලෙස දන්නේ යැ. කැමි නොමුසු[4] සුව විඳුම් විඳින්නේ කැමි නොමුසු සුව විඳුම් විඳිමි යැ යි, මනා ලෙස දන්නේ යැ, කැමි සමුසු දුක් විඳුම් විඳින්නේ කැමි සමුසු දුක් විඳුම් විඳිමි යැ යි මනා ලෙස දන්නේ යැ, කැමි නොමුසු දුක් විඳුම් විඳින්නේ කැමි නොමුසු දුක් විඳුම් විඳිමි යැ යි මනා ලෙස දන්නේ යැ, කැමි සමුසු දුක් ද නැති සුව ද නැති විඳුමන් ද විඳින්නේ කැමි සමුසු දුක් ද නැති සුව ද නැති විඳුමන් ද විඳිමි යැ යි, මනා ලෙස දන්නේ යැ. කැමි නොමුසු දුක් ද නැති සුව ද නැති විඳුමන් ද විඳින්නේ කැමි නොමුසු දුක් ද නැති සුව ද නැති විඳුමන් ද විඳිමි යැ යි මනා ලෙස දන්නේ යැ.

---

1. වේදනාවන්හි
2. වේදනා අනුව
3. සාමිස (කාමය සහිත)
4. නිරාමිස (කාමයෙන් තොර)

මෙ විලසින් තම විඳුම් (එ ම) විඳුම් අනුව දැක වෙසෙන්නේ. මෙ විලසින් අනුන් ගේ විඳුම් විඳුම´නුව දැක වෙසෙන්නේ, තමා ගෙ ද අනුන් ගෙ ද විඳුම් විඳුමනුව දැක වෙසෙන්නේ.

ඇති වීම දහම´නුව විඳුම් දැක වෙසෙන්නේ, නැති වීම දහම´නුව විඳුම් දැක වෙසෙන්නේ, ඇති වීම, නැති වීම දහම´නුව විඳුම් දැක වෙසෙන්නේ.

මෙ විලසින් විඳුමැ පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ විඳුමැ විඳුමනු'ව දැක වෙසෙන්නේ.

***මහ සතර සිහිවටන් සුතුරු එන***
***එ විඳුම'නුදක්නාව නමැති වන***

*දෙ වන වග නිමි වග යි.*

# සිත් අනුදක්නා සිහිවටන

මහණෙනී, මහණ තෙමෙ කෙසේ නම් සිතෙහි සිත අනුව දැක වෙසෙන්නේ?

මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ සරා සිත[1] සරා සිත යැ යි කියා දන්නේ යැ, විරා සිත[2] විරා සිත යැ යි කියා දන්නේ යැ, තරහ සිත තරහ සිත යැ යි, කියා දන්නේ යැ. තරහ නැති සිත තරහ නැති සිතැ යි දන්නේ යැ. මුළා සිත මුළා සිත යැ යි කියා දන්නේ යැ, මුළා නැති සිත මුළා නැති සිතැ යි දන්නේ යැ, මහගු සිත[3] මහගු සිත යැයි කියා දන්නේ යැ, මහගු නැති[4] සිත මහගු නැති සිතැ යි දන්නේ යැ, උතුරු සිත උතුරු සිත යැ යි කියා දන්නේ යැ, එ අනුතුරු සිත එ අනුතුරු සිතැ යි දන්නේ යැ, එකඟ සිත එකඟ සිත යැ යි කියා දන්නේ යැ. එකඟ නැති සිත එකඟ නැති සිතැ යි දන්නේ යැ. මිදුණු සිත මිදුණු සිත යැ යි කියා දන්නේ යැ, නො මැ මිදුණු සිත ද නො මැ මිදුණු සිත යැ යි කියා දන්නේ යැ.

මෙ විලසින් තම සිතෙහි සිත අනුව දැක වෙසෙයි. මෙ විලසින් අනුන් සිතැ සිත අනුව දැක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද සිතෙහි සිත

---

1. සරාග (රාග සහිත) චිත්තය
2. විරාග (රාග රහිත) චිත්තය
3. මහග්ගත
4. අමහග්ගත

අනුව දක වෙසෙන්නේ.

ඇති වීම යන දහම අනුව සිත දක වෙසෙයි, නැති වීම යන දහම අනුව සිත දක වෙසෙයි, ඇති වීම, නැති වීම දහම්'නුව (එ) සිත දක වෙසෙන්නේ.

මෙ විලසින් සිතෙහි පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ ලොවෙහි කවරක් වුව ද (අත් විසින්) දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ සිතෙහි සිත අනුව දක වෙසෙන්නේ.

*මහ සතර සිහිවටන් සුතුරු එන*
*සිත්'නුදක්නා නමැති*
*තෙ වන වග නිමි වග යි.*



# දහම්'නුදක්නා සිහිවටන

මහණෙනී, මහණ තෙමෙ කෙසේ නම් දහමැ දහම්'නුව දක වෙසෙන්නේ.

මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ එ පස් නිවරන (දහම්)[1] දහ'මනුව දකිමින් මැ වෙසෙන්නේ. මහණෙනී, මහණ තෙමෙ එ පස් නිවරන (දහම්) කෙසේ දහමනුව දක වෙසෙන්නේ?

මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ ඇතොත් කම් සැඳ[2] තමා තුළ 'එ කම් සැඳ මෙ මා තුළ ඇතැ යි' මනා ලෙස දන්නේ යැ. නැතොත් කම් සැඳ තමා තුළ 'එ කම් සැඳ මෙ මා තුළ නැතැ යි මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් නො මැ උපන් කම් සැඳ ද උපදිතොත් මනා ලෙස ඒ බව ද දන්නේ යැ. යම් හෙයින් දුරු කැරුණු එ කම් සැඳ මතු වැ හෝ නූපදිත හොත් මනා ලෙස එය ද දන්නේ යැ.

අනුන් නස්නා සිත[3] ද තමා තුළ ඇත හොතින් 'අනුන් නස්නා එ සිත මෙ මා තුළ ඇතැ යි' මනා ලෙස දන්නේ යැ. අනුන් නස්නා එ සිත තමා තුළ නැත හොතින් ' අනුන් නස්නා එ සිත මෙ මා තුළ නැතැ යි' මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් නො මැ උපන් එ මැ අනුන් නසන සිත උපන්නොත් ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් එ මැ නසන සිත පහ වැ යෙ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් පහ වැ ගිය නසන සිත යළි නොඋපදනේ වෙ ද ඒ බව ද මනා ලෙස

1. පංච නීවරණ ධර්ම
2. කාමච්ඡන්ද
3. ව්‍යාපාදය

දන්නේ යැ.

(ගුළි ගැසුණු) අලස සිත[1] තමා තුළ ඇත හොතින් 'අලස සිත මෙ මා තුළ ඇතැ යි' යනු මනා ලෙස දන්නේ යැ. අලස සිත තමා තුළ නැත හොතින් 'අලස සිත මෙ මා තුළ නැතැ යි' යනු මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් නො මැ උපන් අලස සිත උපන්නොත් ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් එ මැ අලස සිත පහ වැ යෙ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් පහ වැ ගිය අලස සිත යළි නොඋපදනේ වෙ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

(නො පිහිටා අරමුණෙක) විසිරි පසුතැවිලි සිත[2] තමා තුළ ඇත හොතින් 'විසිරි පසුතැවිලි සිත මෙ මා තුළ ඇතැ යි යනු මනා ලෙස දන්නේ යැ. විසිරි පසුතැවිලි සිත තමා තුළ නැත හොතින් 'විසිරි පසුතැවිලි සිත මෙ මා තුළ නැතැ යි යනු මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් නො මැ උපන් විසිරි පසුතැවිලි සිත උපන්නොත් ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් එ මැ විසිරි පසුතැවිලි සිත පහ වැ යෙ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් පහ වැ ගිය විසිරි පසුතැවිලි සිත යළි නොඋපදනේ වෙ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

(බුදුන් ඈ අට තැනෙක) සැක පිණිස උපන් සිත[3] තමා තුළ ඇත හොතින් 'එ සැක සිත මෙ මා තුළ ඇතැ යි' යනු මනා ලෙස දන්නේ යැ. එ සැක සිත තමා තුළ නැත හොතින් 'එ සැක සිත මෙ මා තුළ නැතැ යි' යනු මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් නො මැ උපන් එ සැක සිත උපන්නොත් ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් සැක සිත පහ වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් පහ වැ ගිය එ සැක සිත යළි නොඋපදනේ වෙ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

මෙ විලසින් තම දහමැ දහම'නුව දැක වෙසෙයි, මෙ විලසින'නුන් දහමැ දහම'නුව දැක වෙසෙයි, තමා ගෙ ද අනුන් ගෙ ද දහමැ දහමනුව දැක වෙසෙන්නේ.

1. ථීනමිද්ධය

2. උද්ධච්ච කුක්කුච්චය

3. විචිකිච්ඡාව



ඇති වීම යන දහම දහම'නුව දැකැ වෙසෙයි, නැති වීම යන දහම දහම'නුව දැකැ වෙසෙයි, ඇති වීම-නැති වීම දහම් දහමනුව දැකැ වෙසෙන්නේ. මෙ විලසින් දහමැ පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද අත් විසින් දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ එ පස් නිවරන දහමැ දහම'නුව දකිමින් (මැ) වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*
*දහම'නුදක්නා අයත්*
*නිවරන දක්වාලූ*
*පුරුක මෙ තෙකින් නිමියේ.*

1. ධම්මවිචය

# (උවදන්) කඳු පුරුක

නැවැත මහණෙනි, මහණ තෙමේ උවදන් කඳන්[1] හෙවත් දැඩි ලෙස ගැනුම් පසෙකැ දහමෙහි දහම අනුව දැක වෙසෙන්නේ. මහණෙනී, මහණ තෙමෙ කෙසේ නම් එ උවදන් කඳු පසෙහි දහමැ දහමනු'ව දැක වෙසෙන්නේ?. මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ 'රුව[2] මෙ සේ වෙයි, රුවෙහි ඇති වීම මෙ සේ වෙයි, නැති වීම මෙසේ වෙයි, විඳුම[3] මෙ සෙ වෙයි. විඳුමැ ඇති වීම මෙ සේ වෙයි, නැති වීම මෙ සේ වෙයි. සන්[4] මෙ සේ වෙයි, සන්හි ඇති වීම මෙ සේ වෙයි, නැති වීම මෙ සේ වෙයි, සකර[5] මෙ සෙ වෙයි, සකරැ ඇති වීම මෙ සේ වෙයි, නැති වීම මෙ සේ වෙයි, විනැණ[6] මෙ සෙ වෙයි, විනැණැ ඇති වීම මෙ සේ වෙයි, නැති වීම මෙ සේ වෙයි.

ඇති වීම යන දහම දහම'නුව දැකැ වෙසෙයි, නැති වීම යන දහම දහම'නුව දැකැ වෙසෙයි, ඇති වීම-නැති වීම දහම් දහමනුව දැකැ වෙසෙන්නේ. මෙ විලසින් දහමැ පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ. එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද අත් විසින් දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ මෙ පස් උවදන් කඳන් දහමැ දහම'නුව දකිමින් (මැ) වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*

1. උපාදානස්කන්ධ
2. රූපය
3. වේදනාව
4. සංඥාව
5. සංස්කාරය
6. විඥානය



*දහම'නුදක්නා අයත්*
*පස් උවදන් දැක්වූ*
*පුරුක මෙ තෙකින් නිමියේ*

# ආයතන පුරුක

නැවැත මහණෙනි, මහණ තෙමෙ ඇතුළු තැන්-බැහැරි තැන්[1] සයෙකැ දහමෙහි දහම අනුව දැක වෙසෙන්නේ.

මහණෙනී, මහණ තෙමෙ ඇතුළු තැන්-බැහැරි තැන් සයෙක දහමෙහි දහම අනුව දැක කෙසේ නම් වෙසෙන්නේ?.

මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ ඇස මනා ලෙස දනී, රුව මනා ලෙස දනී, එ දෙක හේතුයෙන් යම් සුයොදනෙක්[2] හෙවත් යම් බැඳීමෙක් උපනි නම් එ ද මනා ලෙස දනී, නො මැ උපන් සුයොදනක් උපන්නොත් එ ද මනා ලෙස දනී. උපන් යම් සුයොදනෙක් පහ වැ යෙ ද එ ද මනා ලෙස දනී. පහ වැ ගිය සුයොදනක් යළි නො ඉපැදෙත හොතින් එ ද මනා ලෙස දනී.

කන මනා ලෙස දනී. හඬ මනා ලෙස දනී, එ දෙක හේතුයෙන් යම් සුයොදනෙක් හෙවත් යම් බැඳීමෙක් උපනි නම් එ ද මනා ලෙස දනී. නො මැ උපන් සුයොදනක් උපන්නොත් එ ද මනා ලෙස දනී. උපන් යම් සුයොදනෙක් පහ වැ යෙ ද එ ද මනා ලෙස දනී. පහ වැ ගිය සුයොදනක් යළි නොඉපැදෙත හොතින් එ ද මනා ලෙස දනී.

නැහැය මැනැවින් දනී, ගඳ මනා ලෙස දනී, එ දෙක හේතුයෙන් යම් සුයොදනක් හෙවත් යම් බැඳීමෙක් උපනි නම් එ ද මනා ලෙස දනී,

1. ආධ්‍යාත්මික (අජ්ඣත්තික - බාහිර)
2. සංයෝජනයෙක්

නො මැ උපන් සුයොදනෙක් උපන්නොත් එ ද මනා ලෙස දනී, උපන් යම් සුයොදනෙක් පහ වැ යෙ ද එ ද මනා ලෙස දනී, පහ වැ ගිය සුයොදනක් යළි නො ඉපැදෙත හොතින් එ ද මනා ලෙස දනී.

දිව මනා ලෙස දනී, රස මනා ලෙස දනී, එ දෙක හේතුයෙන් යම් සුයොදනෙක් හෙවත් යම් බැඳීමෙක් උපනි නම් එ ද මනා ලෙස දනී, නො මැ උපන් සුයොදනක් උපන්නොත් එ ද මනා ලෙස දනී, උපන් යම් සුයොදනෙක් පහ වැ යෙ ද එ ද මනා ලෙස දනී, පහ වැ ගිය සුයොදනක් යළි නො ඉපැදෙත හොතින් එ ද මනා ලෙස දනී.

කය මනා ලෙස දනී, පහස මැනැවින් දනී, එ දෙක හේතුයෙන් යම් සුයොදනෙක් හෙවත් යම් බැඳීමෙක් උපනි නම් එ ද මනා ලෙස දනී, නො මැ උපන් සුයොදනක් උපන්නොත් එ ද මනා ලෙස දනී, උපන් යම් සුයොදනෙක් පහ වැ යෙ ද එ ද මනා ලෙස දනී, පහ වැ ගිය සුයොදනක් යළි නො ඉපැදෙත හොතින් එ ද මනා ලෙස දනී.

මන[1] මනා ලෙස දනී, දම්[2] මනා ලෙස දනී, එ දෙක හේතුයෙන් යම් සුයොදනෙක් හෙවත් යම් බැඳීමෙක් උපනි නම් එ ද මනා ලෙස දනී, නො මැ උපන් සුයොදනක් උපන්නොත් එ ද මනා ලෙස දනී. උපන් යම් සුයොදනෙක් පහ වැ යෙ ද එ ද මනා ලෙස දනී, පහ වැ ගිය සුයොදනක් යළි නො ඉපැදෙත හොතින් එ ද මනා ලෙස දනී.

මෙ විලසින් තම දහමැ දහම'නුව දක වෙසෙයි, මෙ විලසින'නුන් දහමැ දහම'නුව දක වෙසෙයි. තමා ගෙ ද අනුන් ගෙ ද දහමැ දහමනුව දක වෙසෙන්නේ.

ඇති වීම යන දහමැ දහම'නුව දකැ වෙසෙයි. නැති වීම යන දහමැ දහම'නුව දකැ වෙසෙයි. ඇති වීම-නැති වීම යන දහම් දහම'නුව දකැ වෙසෙයි. මෙ විලසින් දහමැ පිහිටැවූ සිහියෙන් යුතු වැ වෙසෙන්නේ.

*සතර සිහිවටනැ*
*දහම'නුදක්නා අයත්*
*ස ආයතන දැක්වූ*
*පුරැක මෙ තෙකින් නිමියේ.*

---

1. මනස
2. ධර්මතා



එය මනා සිහි නුවණ වැඩුම් සඳහා මැ වෙයි. (ඇලීමක්, දිටුවක් සෙ කිසි දෙයෙක) නොඇසුරු වැ වෙසෙන්නේ. ලොවෙහි කවරක් වුව ද අත් විසින් දැඩි ලෙසින් නොගන්නේ. මෙ විලසින් මහණ තෙමෙ ඇතුළු හා බැහැරි හා යන ස ආයතනයෙහි දහමැ දහම'නුව දකැ වෙසෙන්නේ.

# බොජ්ඣ පුරුක

නැවැත මහණෙනි, මහණ තෙමෙ දහමැ දහම්'නුව දකින්නේ, සත් බොජඟ[1] හෙවත් ලොවැ නියම අවබෝදයෙහි කොටස් සත දහමැ දහම්'නුව දැකැ වෙසෙන්නේ. මහණෙනී, සත් බොජඟ කවරේ ද කියත හොත්,

මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ සිය සතනැ සිහිය නම් සම්බොජඟ[2] ඇත්තේ ද තමා වෙතැ එ සිහි සම්බොජඟැතැ යි මනා ලෙස දන්නේ යැ, සිය සතනැ සිහිය නම් සම්බොජඟ නැත්තේ ද එ සිහි නම් සම්බොජඟ තමා වෙතැ නැතැ යි යනු මනා ලෙස දන්නේ ය, නො මැ උපන් එ සිහි සම්බොජඟ උපනොත් එ බව මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් සිහි සම්බොජඟ වැඩීමෙන් පිරිපුන් වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේයැ.

සිය සතනැ දම්විචය[1] හෙවත් දම් විමැසීම නමැති සම්බොජඟැ-තොත් තමා වෙතැ දම්විචය සම්බොජඟ ඇතැ යි යනු මනා ලෙස දන්නේ

1. සප්ත බෝධ්‍යංග (සත්ත බොජ්ඣංග)
2. සම්බෝධ්‍යංග (සම්බොජ්ඣංග)
3. ධම්මවිචය



යැ. සිය සතනැ දම්විචය සම්බොජඟ නැත්තේ ද දම්විචය සම්බොජඟ තමා වෙතැ නැතැ යි යනු මනා ලෙස දන්නේ යැ. නො මැ උපන් දම්විචය සම්බොජඟ උපනේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් දම්විචය නම් සම්බොජඟ වැඩීමෙන් පිරිපුන් වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

සිය සතනැ වැර නැමැති සම්බොජඟ ඇත්තේ ද තමා වෙතැ වැර නමැති සම්බොජඟ ඇතැ යි යනු මනා ලෙස දන්නේ යැ. සිය සතන වැර නමැති සම්බොජඟ නැත්තේ ද වැර නමැති සම්බොජඟ තමා වෙතැ නැතැ යි යනු මනා ලෙස දන්නේ යැ, නො මැ උපන් වැර නමැති සම්බොජඟ උපනේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් වැර සම්බොජඟ වැඩීමෙන් පිරිපුන් වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

සිය සතනැ පීති නම් සම්බොජඟ ඇත්තේ ද තමා වෙතැ පීති නම් සම්බොජඟ ඇතැ යි යනු මනා ලෙස දන්නේ යැ, සිය සතනැ පීති නම් සම්බොජඟ නැත්තේ ද පීති නම් සම්බොජඟ තමා වෙතැ නැතැ යි යනු මනා ලෙස දන්නේ යැ, නො මැ උපන් පීති නම් සම්බොජඟ උපනේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ, යම් හෙයින් උපන් ඒ පීති නම් සම්බොජඟ වැඩීමෙන් පිරිපුන් වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

සිය සතනැ පස්සද්දි හෙවත් සන්සුන් බවැ යි යෙන එ සම්බොජඟැතොත් තමා වෙතැ පස්සද්දි සම්බොජඟ ඇතැ යි යනු මනා ලෙස දන්නේ යැ, සිය සතනැ පස්සද්දි සම්බොජඟ නැතොත් එ ද පස්සද්දි සම්බොජඟ තමා වෙතැ නැතැ යි යනු මනා ලෙස දන්නේ යැ, නො මැ උපන් පස්සද්දි සම්බොජඟ උපනේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ. යම් හෙයින් උපන් ඒ පස්සද්දි සම්බොජඟ වැඩීමෙන් පිරිපුන් වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

සිය සතනැ සමාදී සම්බොජඟ ඇත්තේ ද තමා වෙතැ සමාදී සම්බොජඟ ඇතැ යි යනු මනා ලෙස දන්නේ යැ, සිය සතනැ සමාදී

1. උපේක්ෂා

සම්බොජඟ නැත්තේ ද තමා වෙතැ සමාදී සම්බොජඟ නැතැ යි යනු මනා ලෙස දන්නේ යැ, නො මැ උපන් සමාදී සම්බොජඟ උපනේ ද ඒ බව ද මනා ලෙස දන්නේ ය, යම් හෙයින් උපන් ඒ සමාදී සම්බොජඟ වැඩීමෙන් පිරිපුන් වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.

සිය සතනැ උවෙක්සා හෙවත් මැදහත් බවැ යි යෙන එ සම්බොජඟැ'තොත් තමා වෙතැ උවෙක්සා[1] සම්බොජඟ ඇතැ යි යනු මනා ලෙස දන්නේ යැ, සිය සතනැ උවෙක්සා සම්බොජඟ නැතොත් එ ද උවෙක්සා සම්බොජඟ තමා වෙත නැතැ යි යනු මනා ලෙස දන්නේ යැ, නො මැ උපන් උවෙක්සා සම්බොජඟ උපනේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ, යම් හෙයින් උපන් ඒ උවෙක්සා සම්බොජඟ වැඩීමෙන් පිරිපුන් වැ යන්නේ ද ඒ බව ද මනා ලෙස දන්නේ යැ.෴

*සතර සිහිවටනැ*
*දහම'නුදක්නා අයත්*
*එ සත් බොජඟ දැක්වූ*

*පුරුක මෙ තෙකින් නිමියේ.*

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*සිවුසස් නිදෙසට පෙර*
*පළමු බණවර නිමියේ.*

# දුක් සස් නිදෙස

නැවැත මහණෙනි, මහණ තෙමෙ අරී සස්[1] සතරෙහි මැ දහමැ දහම'නුව දකැ වෙසෙන්නේ මහණෙනී, මහණ තෙමෙ කෙසේ නම් අරී සස් සතරෙහි මැ දහමැ දහ'මනුව දකැ වෙසෙන්නේ?

මහණෙනී, මෙ(සස්නෙහි) මහණ තෙමෙ මේ දුක යැ ඇති තතු සෙ මනා ලෙස දන්නේ යැ. මේ එ දුක ඇති වීම ඇති තතු සෙ මනා ලෙස දන්නේ යැ. මේ එ දුක් නිරොදය යැ ඇති තතු සෙ මනා ලෙස දන්නේ යැ. මේ එ දුක් නිරොදයට යන ගමන් පිළිවෙළ යැ ඇති තතු සෙ මනා ලෙස දන්නේ යැ.

මහණෙනී, දුක් අරී සස් කෙසේ වේ ද යත්, ඉපැදීම දුකෙක් වෙයි. ජරාව ද - දිරායැම - ද දුකෙකි. රෝග (හටගනු) දුකෙකි. මරණය ද දුකෙක් වෙයි, සෝ වලප[1] දෙක දුක යැ (කයෙහි) දුක, දොම්නස ද, (සිතෙහි වන) දැඩි පෙළුම යනු දුක් යැ, අපියයන් එක් වීම දුකෙක් වෙයි. පියයන්

1. ශෝක පරිදේව
2. පංච උපාදානස්කන්ධය
3. ඉඳුරන් නොපිරිපුන් වැ ඉපැදීම
4.ඉඳුරන් පිරිපුන් වැ ඉපැදීම
5. සංසේදජ - ඕපපාතික වශයෙන් ඉපැදීම
6. ස්කන්ධ

ගෙ වෙන් වීම දුකෙක් වෙයි. පැතූ දේ නොලැබුම ද දුකෙක් වෙයි. කෙටි වැ කිව හොත් මෙ පස් කඳ මැ උවදන්[2] දුකෙක් වන්නේ ය.

මහණෙනි, ඉපැදීම - ජාතිය - යැ යනු කිම ද කියත හොත් මෙ එක් එක් සතුන් ගේ, එකෙ'ක සත් කොටස්වලැ ඉපැදුම්'යැ[3], සපිරි වූ ඉපැදුම යැ[4], මවු කුසෙහි පිළිසිඳීම යැ, ඉබේ ඉපැදුම[5] යැ, කඳ[6] පහළ වීම හා (ස) ඉඳුරන් ලැබුම හා යන මෙයට මහණෙනී ජාතිය යැ කියන්නේ.

මහණෙනි, දිරායන බව හෙවත් ජරාව යැ යනු කිම ද කියත හොත් මෙ එක් එක් සතුන් ගේ, එකෙ'ක සත් කොටස්වලැ දිරායන සුලු බවෙක්, (ඇට ද දත් ආදියේ) කැඩීයන සුලු බවෙක් (කෙස් ද ලොම් ආදියේ) පැසීයන සුලු බවෙක්, (සිරුරෙහි ද) රැලි වැටෙන සුලු බවෙක්, ආයුවෙහි ගෙවීමෙක්, ඉඳුරන් ද පිරිපැසීයන[1] බවෙක් වේ ද මහණෙනි, එයට ජරාවැ යි කියන්නේ.

මහණෙනි, මරනය යැ යනු කිම ද කියත හොත් මෙ එක් එක් සතුන් ගෙ එකෙ'ක සත් කොටස්වලැ සැවීමෙක් - චුත වැ යෑමෙක්, එ සේ සැවීයන සුලු බවෙක්, බිඳීමෙක් මෙ (පස් කඳ) අතුරුදන් වීමෙක් ද මියීමෙක්,[2] මරනයෙක්, කළුරියෙක්, (පස් කඳෙහි) බිඳීමෙක්, සිරුර හැරයාමෙකුත් දිවි ඉඳුර[3] සිඳුමෙකුත් වේ ද මහණෙනි, මෙයට මරණ යැ යි කියන්නේ.

මහණෙනි, සොව[4] යැ යෙනු කිමෙක් දැ යි කියත හොත්, මහණෙනී, නෙක් ලෙසින් වන වැසන'තුරින් එක්තරා වැසනෙකින් යුත් නොයෙක් දුක් දහම් අතුරින් ද එක්තරා දුක් දහමෙකින් පෙළුණක්හු හට ඇති වැ යන සොවෙක්, සෝ කරන සුලු බවෙක්, එ සේ සෝ කළ බවෙක් (සිරුර වියළවනසුලු) ඇතුළත්හි වූ සොවෙක්, ඇතුළත්හි සියලු තැනැ වූ සොවෙක් වේ ද මහණෙනි, මෙයට සොව කියා කියන්නේ.

මහණෙනි, වැලැපීම[5] කිමෙක් දැ යි කියත හොත් මහණෙනී, නෙක ලෙසින් වන වැසන'තුරින් එක්තරා වැසනෙකින් යුත් නොයෙක්

1. පරිපාකයට පත් වන (මෝරන)
2. මිය යෑමෙක්
3. ජීවිතේන්ද්‍රියය
4. ශෝකය
5. පරිදේවය
6. සුව නැති බව, අමිහිරි බව
7. ස්පර්ශයෙන්



දුක් කරුණු අතුරින් ද එක්තරා දුක් කරුණෙකින් පෙළුණු තැනැත්තහු ඇඬුම හා වැලැපීම, අඬනයුරු, වලප්නා අයුරු හා අඬන බව යන මෙයට වැලැපීම කියන්නේ මහණෙනී.

මහණෙනී, දුක යැ යෙනු කිමෙක් දැ යි කියත හොත් මහණෙනී, කයට වන යම් දුකෙක්, කයට වන නුසුවයෙක්,[6] පැහැසුමෙන්[7] කයෙහි හටගත් දුකෙක්, නුසුව විඳුමෙක් වේ ද මහණෙනී, මෙයට වෙයි දුක කියා කියන්නේ.

මහණෙනී, එ දොම්නස කිමෙක් දැ යි කියත හොත් මහණෙනී, සිතෙහි වන යම් දුකෙක්, සිතෙහි වන නුසුවයෙක් (යමකු) සිතැ පැහැසුමෙන් හටගැනුණු නුසුව දුක් විඳීමෙක් වේ ද, මහණෙනි, මෙයට දොම්නසැ යි කියන්නේ.

මහණෙනී, උපායාසය (හෙවත් සිතේ වන තද පෙළුම) කිමෙක් දැ යි කියත හොත් මහණෙනී, නෙක ලෙසින් වන වැසන'තුරින්[1] එක්තරා වැසනෙකින් යුත් නොයෙක් දුක් කරුණු අතරින් ද එක්තරා දුක් කරුණෙකින් පෙළුණහුට පහළ වන (සිතේ) පෙළුමෙක් වේ ද, පබල පෙළුමෙක් වේ ද මහණෙනී, උපායාසය කියන්නේ මෙය ම වන්නේ යැ.

මහණෙනී, අපියයන්[2] සමඟ එක් වීමැ දුක කිමෙක් දැ යි කියත හොත් යමෙක් ඔබ හට අනිටු[3] (සිත්) නොඅදනා මෙන් මැ නොරිසි වූ රුවෙක් හෝ, හඬෙක් හෝ ගඳෙක් හෝ රසෙක්, හෝ පහසෙක් හො දහමෙක්[4] හො වන්නේ ද ඔබට කිසිවෙක් අවැඩදා[5], වෙත් ද අහිතකර, අපාසුවෙහි ද හෙළන, පිහිටකුදු නොවන සුලු වෙත් ද ඔවුනුත් සමඟ එක් වැ යෑම ද එකතු වීම, මුසු වීම හා මහණෙනී, අපියයන් සමඟ එක් වීම නම් දුක කියා කියන්නේ.

මහණෙනී, පියයන් ගෙ වෙන් වීමැ තිබෙන දුක කිමෙක් දැ යි

1. ව්‍යසන අතුරින්
2. අප්‍රිය වූවන්
3. අනිෂ්ට
4. ධර්මතාවෙක්
5. අවැඩ දායක

කියත හොත් යමෙක් ඔබ හට ඉටු ද (සිතත්) අදනේ වේ ද ඉතා රිසි රුවෙක් හෝ හඬෙක් හෝ ගඳෙක් හෝ රසෙක් හෝ පහසෙක් හො දහමෙක් හො වන්නේ ද ඔබට වැඩ දා මෙන් මැ, හිතකර ද පාසු සලසන සුලු ද උවදුරින් තොර වීම කැමැති වන්නා වූ ද මවක් හෝ පියෙක් හෝ සෝවුරෙක්, එ සෝවිරියක් හො දෙටු, කනිටු, මිතු, හිත කැමැති, සහලෙයැති නෑයෙක් හො වන්නේ ද ඔවුන් හා සමඟ එක් වැ මැ යෑම, එකට එක් වීම, මුසු වීම හෝ නො ලැබුණොත් මහණෙනී, පියයන් ගෙ වෙන් වීමැ දුක මෙය යැ කියන්නේ.

මහණෙනී, රිසි දෙයක් නොලැබීමැ දුක කිමෙක් දූ යි කියා කියත හොත් මහණෙනී, බෙවෙහි[1] ඉපැදෙනසුලු වැ සිටින සත්නට 'මෙ අපි බෙවෙහි ඉපැදෙනසුලු වැ සිටින සත් නොවුවමෝ නම් මැනැවි, අප කරා එ මැ බෙවෙහි ඉපැදීම නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය ඇති වේ යැ. එ මැ රිසිය අනුවැ එය නොවන්නේ මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, දිරායන සුලු වැ සිටුනා සතන් හට 'මෙ අපි දිරායන සුලු සත්හු නොවුවමෝ නම් මැනැවි, අප කරා එ ජරාව නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය වන්නේ යැ. එ මැ රිසිය අනුවැ එය නොවන්නේ. මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, නෙක් ලෙඩින් පෙළෙනසුලු සතන් හට 'මෙ අපි එ ලෙඩින් පෙළෙනසුලු සත්හු නොවුවමෝ නම් මැනැවි, අප කරා එ ලෙඩ නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය ඇති වේ යැ. එ මැ රිසිය අනුවැ එය නොවන්නේ, මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, මැරෙනසුලු සතන් හට 'අපි මැරෙනසුලු සත්හු නොවුවමෝ නම් මැනැවි, අප කරා මරණය ද නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය වන්නේ යැ, එ මැ රිසිය අනුව එය නොවන්නේ මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, සෝ කරන සුලු සතන් හට 'මෙ අපි සෝ කරන සුලු සත්හු නොවුවමෝ නම් මැනැවි, අප කරා එ සෝකය නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය වන්නේ යැ. එ මැ රිසිය අනුව එය නොවන්නේ. මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, වලප්නා සුලු සතන් හට 'මෙ අපි වලප්නා සුලු සත්හු නොවුවමෝ නම් මැනැවි, අප කරා එ වැලැපුම නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය වන්නේ යැ. එ මැ රිසිය අනුව එය නොවන්නේ, මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, (කයැ) දුකින් පෙළෙන සුලු සතන් හට 'කයැ දුකින් පෙළෙන සත් නොවුවමෝ නම් මැනැවි අප කරා එ (කයැ) දුක නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය වන්නේ යැ. එ මැ රිසිය අනුවැ එය නොවන්නේ මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, දොම්නසින් පෙළෙන සුලු සතන් හට 'දොම්නසින් පෙළෙන සත් නොවුවමෝ නම් මැනැවි, අප කරා එ දොම්නස නො පැමුණුණ හොත් මැනැවි' යන රිසිය වන්නේ යැ. එ මැ රිසිය අනුව එය නොවන්නේ. මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, දැඩි මැ ආයාසයෙන් පෙළෙන සුලු සතන් හට 'එ දැඩි ආයාසයෙන් පෙළෙන සුලු සත්හු නොවුවමෝ නම් මැනැවි, අපි. අප කරා එ ආයාසය නොපැමුණුණ හොත් මැනැවි' යන රිසිය වන්නේ යැ. එ මැ රිසිය අනුව එය නොවන්නේ. මෙය ද රිසි දෙයක් නොලැබීම දුක වන්නේ යැ.

මහණෙනී, සැකෙවින් මැ දුක් සහිත මෙ පස් උවදන් කඳන්[1]

---

1. උපාදානස්කන්ධ
2. රූප උපාදානස්කන්ධ
3. සංඥා උපාදානස්කන්ධ
4. සංස්කාර උපාදානස්කන්ධ
5. විඥාන උපාදානස්කන්ධ
6. චතුස්සත්‍ය නිර්දේශයෙහි
7. දුඃඛ සත්‍ය නිර්දේශය

කවරේ ද? එ රූ උවදන් කඳ[2] යැ, එ සන් උවදන් කඳ[3] යැ, සකර උවදන් කඳ[4] යැ, විනැණ උවදන් කඳ[5] යැ යන මේ යැ මහණෙනී, සැකෙවින් මැ එ පස් උවදන් කඳන් කියන්නේ. මහණෙනී, මේ යැ දුක් අරී සස් කියන්නේ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*සිවු සස් නිදෙසෙහි [6] එන*
*දුක් සස් නිදෙස [7] නිමියේ.*

## සමුදය සස් නිදෙස

මහණෙනී, එ දුක් සමුදය අරී සස්[1] කිම ද? පුනපුනා ඉපැදුමක් ලබාදෙන එ ඒ දෙයැ කැමැත්තෙන් ඇලෙනසුලු සබව ඇති එ ඒ උපතැ දී අබිනඳන (වෙසෙසි ලෙස සතුටු වන) සබව ඇති කාම තණ්හා යැ, බව තණ්හා යැ, විබව තණ්හා යැ යෙන වේ ද තණ්හාවෙකුත්, ඒ එය මැ වන්නෙ යැ.

මහණෙනී, තණ්හාව උපදිනුයෙ කො තැනෙකැ ද (වැදූගෙනැ මැ) සිටිනුයේ කො තැනෙකැ ද? යමෙක් ලොවැ පිය සොබා ඇත්තේ ද මිහිරි බව ඇත්තේ ද එහි යැ තණ්හාව නම් උපදනේ, (පිහිටා මැ) සිටිනුයේ. කිමෙක් ලොවැ පිය සොබා ඇත්තේ ද, මිහිරි බව ඇත්තේ ද?

### ඇතුළු ආයතන සය

1. දුඃඛ සමුදය ආර්ය සත්‍යය
2. ප්‍රිය වූ ස්වභාවය



ලොවැ ඇසෙහි පිය සොබා[2] ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ සවනැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ නැහැයැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ දිවෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ කයෙහි පිය සොබා ඇත්තේ යැ. මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ මනසැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*මෙ ඇතුළු ආයතන සය*

### බැහැරි ආයතන සය

ලොවැ රුවෙහි පිය සොබා ඇත්තේ යැ. මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ හඬෙහි පිය සොබා ඇත්තේ යැ. මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ ගඳෙහි[1] පිය සොබා ඇත්තේ යැ. මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ රසෙහි පිය සොබා ඇත්තේ යැ. මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ පහසැ[2] පිය සොබා ඇත්තේ යැ. මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ දහමැ[3] පිය සොබා ඇත්තේ යැ. මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව

1. ගන්ධයෙහි (ගඳ-සුවඳ දෙක මැ ගැනේ)
2. ස්පර්ශයෙහි
3. ධර්මතාවලැ

උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*මෙ බැහැරි ආයතන සය*

# විනැණ සය

ලොවැ දකුම් විනැණ[1] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ ඇසුම් විනැණ[2] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවෙහි ඇගැරුම් විනැණ[3] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවෙහි දිව් විනැණ[4] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවෙහි කා විනැණ[5] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවෙහි මන විනැණ[6] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ,

1. චක්ෂුර් විඥානය
2. ශ්‍රෝත්‍ර විඥානය
3. ඝ්‍රාණ විඥානය
4. ජිහ්වා විඥානය
5. කාය විඥානය
6. මනෝ විඥානය



තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*විනැණ සය මින් නිමියේ*

# පහස් සය

ලොවැ ඇසෙහි ගැටුම[1] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ සවනැ ගැටුම[2] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ නැහැයැ ගැටුම[3] පිය වූ සොබා ඇත්තේ ය. මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ දිවෙහි ගැටුම[4] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ ය, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ කයෙහි ගැටුම[5] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ

1. චක්ඛුඃ සංස්පර්ශය
2. ශ්‍රෝත්‍ර සංස්පර්ශය
3. ඝ්‍රාණ සංස්පර්ශය
4. ජිහ්වා සංස්පර්ශය
5. කාය සංස්පර්ශය
6. මනඃ සංස්පර්ශය

මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ මනසැ ගැටුම්[6] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*පහස් සය මින් නිමියේ*

# විඳුම් සය

ලොවැ ඇසෙහි ගැටීමෙන් උපන්නා වූ විඳුම්[1] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ සවනැ ගැටීමෙන් උපන්නා වූ විඳුම්[2] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ නැහැයැ ගැටීමෙන් උපන්නා වූ විඳුම්[3] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ දිවෙහි ගැටීමෙන් උපන්නා වූ විඳුම්[4] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ කයෙහි ගැටීමෙන් උපන්නා වූ විඳුම්[5] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම

1. ඇසෙහි රුවක් ගැටීමෙන් ඇති වන වින්දනය (වේදනාව)
2. සවනෙහි හඬක් ගැටීමෙන් ඇති වන වින්දනය (වේදනාව)
3. නැහැයෙහි ගඳක් හෝ සුවඳක් හෝ ගැටීමෙන් ඇති වන වින්දනය (වේදනාව)
4. දිවෙහි රසයක් ගැටීමෙන් ඇති වන වින්දනය (වේදනාව)
5. කයෙහි ද්‍රව්‍යයක් ගැටීමෙන් ඇති වන වින්දනය (වේදනාව)
6. මනසෙහි යම් සිතිවිල්ලක් ගැටීමෙන් ඇති වන වින්දනය (වේදනාව)



පිහිටන්නේ යැ, ලොවැ මනසැ ගැටීමෙන් උපන්නා වූ විඳුම්[6] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*විඳුම් සය මින් නිමියේ*

# සන් සය

ලොවෙහි රූ යන සනෙහි[1] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි පිහිටන්නේ යැ. ලොවෙහි හඬ යන සනෙහි[2] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි ගඳ යන සනෙහි[3] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ ය. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි රස යන සනෙහි[4] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවැ පහස් යන සනෙහි[5] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

1. රූප යන සංඥාවෙහි
2. ශබ්ද යන සංඥාවෙහි
3. ගන්ධ (ගඳ-සුවඳ) යන සංඥාවෙහි
4. රස යන සංඥාවෙහි
5. ස්පර්ශ යන සංඥාවෙහි
6. ධර්මතා යන සංඥාවෙහි

ලොවැ දහම් යන සනෙහි[6] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ ය.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*සන් සය මෙයින් නිමියේ*

# සිතුම් සය

ලොවෙහි රූ යන සිතුමැ[1] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවෙහි හඬ යන සිතුමැ[2] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි ගඳ යන සිතුමැ[3] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි රස යන සිතුමැ[4] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ පහස යන සිතුමැ[5] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ දහම

1. රූප සංචේතනාවෙහි
2. ශබ්ද සංචේතනාවෙහි
3. ගන්ධ සංචේතනාවෙහි
4. රස සංචේතනාවෙහි
5. ස්පර්ශ සංචේතනාවෙහි
6. ධර්ම සංචේතනාවෙහි



යන සිතුමැ[6] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ ය.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*සිතුම් සය මින් නිමියේ*

# තණ්හා සය

ලොවෙහි රූ තණ්හාවැ[1] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි හඬ තණ්හාවැ[2] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි ගඳ තණ්හාවැ[3] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි රස තණ්හාවැ[4] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ පහස් තණ්හාවැ[5] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ ය, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ දහම්

1. රූප තෘෂ්ණාවෙහි
2. ශබ්ද තෘෂ්ණාවෙහි
3. ගන්ධ තෘෂ්ණාවෙහි
4. රස තෘෂ්ණාවෙහි
5. ස්පර්ශ තෘෂ්ණාවෙහි
6. ධර්ම තෘෂ්ණාවෙහි

තණ්හාවැ[6] පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*තණ්හා සය මෙ නිමියේ*

# විතක් සය

ලොවෙහි රූ විතක්[1] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි හඬ විතක්[2] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ, ලොවෙහි ගඳ විතක්[3] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි රස විතක්[4] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ පහස් විතක්[5] පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම

1. විතක් (විතර්ක) නම් සිතින් යම් අරමුණක් ගැන්ම යි. රූ විතක් (රූප විතර්ක) නම් රූපය පිළිබඳ අරමුණක් ගැන්ම යි. හඬ විතක් (ශබ්ද විතර්ක) ගඳ විතක් (ගන්ධ විතර්ක) ආදිය ද මෙ සේ මැ යි.



උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ දහම් විතක්[6] පිය සොබා ඇත්තේ ය, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ ය, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හටගැනුමෙහි එන*
*විතක් සය මින් නිමියේ*

# විචාර සය

ලොවෙහි රූ විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි හඬ විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ. පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි ගඳ විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවෙහි රස විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ පහස් විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ. ලොවැ දහම් විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව උපදිනුයෙ මෙහි ම උපදින්නේ යැ, පිහිටනුයෙ මෙහි ම පිහිටන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*

1. විචාරය නම් සිතින් ගත් අරමුණ නැවැත නැවැත විමැසීම යි. රූප විචාරය නම් රූපය පිළිබඳ වැ ගත් අරමුණ නැවැත නැවැත විමැසීම යි. හඬ විචාරය (ශබ්ද විචාරය), ගඳ විචාරය (ගන්ධ විචාරය) ආදිය ද මෙ සේ මැ යි.

*දුක් හටගැනුමෙහි එන*
*විචාර සය මෙ නිමියේ*

***සතර සිහිවටනැ***
***දහම් අනුදක්නාවේ***
***සිවු සස් නිදෙසෙහි දුක්***
***හටගැනුම’රී සස් නිමි.***

## නිරොද සස් නිදෙස

මහණෙනී, දුක් නිරොද අරී සස් නම් කිම ද? එ තණ්හාවෙහි කිසි දු ලෙසින් නො මැ ඇලීමක්, මුළුමනින් එ නැසුමක්, එ අත්හැරැ දැමීමක් එ දුරැලා දැමීමක්, එයින් අත්මිදීමක්, එයට ආසා කිසිත් නැති බවක් වීම වේ.

මහණෙනී, තණ්හාව පහ වැ යන්නේ කො තැනැ පහ වේ ද? නැසීයන්නේ කො තැනැ නැසීයෙ ද? යමෙක් ලොවැ පිය සොබා ඇත්තේ ද, මිහිරි බව ඇත්තේ ද තණ්හාව පහ වැ යන්නේ එහි මැ පහ වැ යේ, නැසී යන්නේ  එහි මැ නැසී යේ. කිමෙක් ලොවැ පිය සොබා ඇත්තේ ද, මිහිරි බව ඇත්තේ ද, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ ය, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

## ඇතුළු ආයතන සය

ලොවැ ඇසෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයේ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ, ලොවැ නැහැයැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ, ලොවැ සවනැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ නැහැයැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ, ලොවැ දිවෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ, ලොවැ කයෙහි පිය

සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයේ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ මනසැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දූක්වෙන*
*මෙ ඇතුළු ආයතන සය*

# බැහැරී ආයතන සය

ලොවැ රූවෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ, ලොවැ හඬෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ ගඳෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ රසෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ පහසැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ දහමැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දූක්වෙන*
*මෙ බැහැරි ආයතන සය*

# විනැණ සය

ලොවැ දකුම් විනැණ පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ ඇසුම් විනැණ පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි ඇඟැරුම් විනැණ පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි දිව් විනැණ පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි කා විනැණ. පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ ය, නැසෙනුයේ

මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි මන විනැණ පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දැක්වෙන*
*විනැණ සය මින් නිමියේ*

## පහස් සය

ලොවැ ඇසෙහි ගැටුම පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ සවනැ ගැටුම පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ නැහැයැ ගැටුම පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ දිවෙහි ගැටුම පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ කයෙහි ගැටුම පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ මනසැ ගැටුම පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දැක්වෙන*
*පහස් සය මින් නිමියේ*

## විඳුම් සය

ලොවැ ඇසෙහි ගැටීමෙන් උපන්නා වූ විඳුම පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ සවනැ ගැටීමෙන් උපන්නා වූ විඳුම පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ නැහැයැ ගැටීමෙන් උපන්නා වූ විඳුම පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ දිවෙහි ගැටීමෙන් උපන්නා වූ විඳුම පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ

යැ. ලොවැ කයෙහි ගැටීමෙන් උපන්නා වූ විඳුම පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ මනසැ ගැටීමෙන් උපන්නා වූ විඳුම පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දැක්වෙන*
*විඳුම් සය මින් නිමියේ*

## සන් සය

ලොවෙහි රූ යන සනෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි හඬ යන සනෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි ගඳ යන සනෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි රස යන සනෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ පහස යන සනෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ, ලොවැ දහම් යන සනෙහි පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දැක්වෙන*
*සන් සය මෙයින් නිමියේ*

## සිතුම් සය

ලොවෙහි රූ යන සිතුමැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි හඬ යන සිතුමැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි ගඳ යන සිතුමැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි රස යන සිතුමැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ

යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ පහස යන සිතුමැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ දහම් යන සිතුමැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දැක්වෙන*
*සිතුම් සය මින් නිමියේ*

## තණ්හා සය

ලොවෙහි රූ තණ්හාවැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි හඬ තණ්හාවැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි ගඳ තණ්හාවැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ ය, ලොවෙහි රස තණ්හාවැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ

වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ ය. ලොවැ පහස් තණ්හාවැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ දහම් තණ්හාවැ පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දැක්වෙන*
*තණ්හා සය මෙ නිමියේ*

## විතක් සය

ලොවෙහි රූ විතක් පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි හඬ විතක් පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි ගඳ විතක් පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ ය, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි රස විතක් පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ

වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැහි පහස් විතක් පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැහි දහම් විතක් පිය වූ සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොදෙහි දැක්වෙන*
*විතක් සය මින් නිමියේ*

## විචාර සය

ලොවෙහි රූ විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ. තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි හඬ විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි ගඳ විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ ය, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවෙහි රස විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ ය, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ පහස් විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ නැසෙන්නේ යැ. ලොවැ දහම් විචාරය පිය සොබා ඇත්තේ යැ, මිහිරි බව ඇත්තේ යැ, තණ්හාව පහ වනුයෙ මෙහි ම පහ වන්නේ යැ, නැසෙනුයේ මෙහි ම එ



නැසෙන්නේ යැ.

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් හට ගැනුමෙහි එන*
*විචාර සය මෙ නිමියේ*

***සතර සිහිවටනැ***
***දහම් අනුදක්නාවේ***
***සිවු සස් නිදෙසෙහි එන***
***දුක් නිරොද'රී සස් නිමි.***

## නිරොද මං සස් නිදෙස

මහණෙනී, දුක් නිරොද වෙතට යන මඟ සහිත අරී සස් කවරේ ද? මේ අරී අටඟ මඟ වෙයි, එ නම් හරි දිටුව, හරි සිතුම, හරි වදන, හරි කමත, හරි දිවිය මෙන් ම හරි වැයම ද හරි සිහිය, හරි සමාදිය යැ යන මෙ අඟ අට වන්නේ යැ.

මහණෙනී, හරි දිටුව[1] යනු කිමෙකැ? මහණෙනී, දුකෙහි, දුක් හට ගැනුමැ, එ දුක් වැනැසුම්හි, ඒ වැනැසුමට යන මඟෙහි යම් නැණෙක් වේ ද මහණෙනි, එයට හරි දිටුව කියන්නේ..

---

1. සම්‍යග්දෘෂ්ටිය (සම්මා දිට්ඨි)
2. සම්‍යක් සංකල්පය (සම්මා සංකප්ප)
3. සම්‍යග්වචනය (සම්මා වාචා)
4. මෘෂාවාදයෙන් (මුසාවාදයෙන්)
5. සම්‍යක් කර්මාන්තය (සම්මා කම්මන්ත)
6. කාම මිථ්‍යාචාරයෙන්

මහණෙනි, හරි සිතුම[2] යනු කිමෙකැ? (කෙලෙස්) දුරු කිරීමේ සිතුම හා නපුරු අදහසින් තොර සිතුම හා අහිංසා සිතුම හා යන මෙයට මහණෙනි, හරි සිතුම කියන්නේ..

මහණෙනි, හරි වදන[3] යනු කිමෙකැ? මුස බසින්[4] වෙන් වීම, කේලමින් වෙන් වීම, පරුස වදනින් ද වෙන් වීම, පල නැති නිසරු වදනින් ද වෙන් වීම යන මෙයට මහණෙනි, හරි වදන කියන්නේ..

මහණෙනි හරි කමත[5] යනු කිමෙකැ? (සතුන්) පණ නැසීමෙන් වෙන් වීම, නුදුන් දේ ගැනීමෙන් වෙන් වීම, වැරැදි කම් හසරිනුදු[6] වෙන් වීම යන මෙයට මහණෙනි, හරි කමත කියන්නේ..

මහණෙනි, හරි මැ වෑයම කිමෙකැ? මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙමෙ නො මැ උපන් පවිටු අකුසල් නොඋපදවනු වස් රිසිය දනවන්නේ ද, වෑයමුත් කරනේ ද , විරිය අරඹින්නේ ද සිත උසහ කරනේ ද පදන් වැර[1] වඩනේ ද උපන්නා වූ පවිටු දහම් අකුසල් නසනු පිණිස රිසි දනවා ද වෑයමුත් කරනේ ද විරිය අරඹින්නේ ද, සිත උසහ කරනේ ද, පදන් වැර වඩනේ ද, නො මැ උපන් කුසල දම් උපදවනු පිණිස රිසි දනවා ද වෑයමුත් කරනේ ද විරිය අරඹින්නේ ද, සිත උසහ කරනේ ද, පදන් වැර වඩනේ ද, උපන්නා වූ කුසල දම් තබාගනු පිණිස, ඒ නොනස්නා පිණිස ඒ බොහෝ වනු, මහත් වනු, සපිරි වනු පිණිස රිසිය දනවන්නේ ද, වෑයමුත් කරනේ ද, විරිය අරඹින්නේ ද සිත උසහ කරනේ ද, පදන් වැර වඩනේ ද මහණෙනි, එය යැ හරි වෑයමැ යි කියන්නේ.

මහණෙනි, හරි දිවිය[2] යනු කිමෙකැ? මහණෙනී මෙ (සස්නෙහි) අරී සවු[3] වැරැදි දිවි පෙවෙත හැරැ හරි මැ දිවි පෙවෙතෙකින් දිවිය ගත කරනේ ද එයට වෙයි මහණෙනි, හරි දිවිය කියන්නේ.

මහණෙනි, හරි සිහිය නම් කිමෙකැ? මහණෙනී මෙ (සස්නෙහි) මහණ තෙමෙ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ කයෙහි කය'නුව බලා වෙසෙන්නේ.

මහණ තෙමෙ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ විඳුමැ විඳු'මනුව දැකැ වෙසෙන්නේ.

මහණ තෙමෙ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ සිතෙහි සිත'නුව බලා වෙසෙන්නේ..

මහණ තෙමෙ මනා නුවණින් මනා සිහියෙන් ද සුසැදුණේ දැඩි ලොබ ද දොම්නස ද දුරු කෙළේ දහමැ දහම'නුව දැකැ වෙසෙන්නේ..

මහණෙනී එයට හරි සිහිය යැ යි කියන්නේ.

මහණෙනී, හරි සමාදිය කිමෙකැ? මහණෙනී, මෙ (සස්නෙහි) මහණ තෙමෙ කැමින් හා ඒ අකුසල් දහමිනුදු වෙන් වැ ගෙනැ විතක් හා විචාර ද සහිත වූ විවේකෙන් උපන් පීතිය, සුවය ඇති පළමු දැහැන ලැබැ වෙසෙන්නේ, එ මැ විතක් විචාර ද දෙකෙහි සන්සිඳීමෙන් සිය සතනැ මනා පැහැදීම දෙන විතක් හා විචාර ද රහිත වූ සිතැ සමාදියෙනු'පන් පීති සුව (දෙක මැ) ඇති දෙ වැනි දැහැන ද ලබා වෙසෙන්නේ, පීතියෙන් හා වෙන් වැ උවෙක්සාවෙන් (හෙ තෙමෙ) වෙසෙන්නේ, සිහියෙනුදු මනා නැණිනුදු යුතු වැ කයින් සුව විඳින්නේ, උවෙක්සා සිහි ද සුව විසුම් ඇති යැ යි අරී දන කියන තෙ වැනි දැහැන ද ලබා වෙසෙන්නේ, සුව ද පහ කරන්නේ, දුක ද පහ කරන්නේ පළමු වැ ම සොම්නස් ද දොම්නස් ද දෙකෙහි සන්සිඳීමෙන් දුක් විඳුම් සුව විඳුම් නැති උවෙක්සා ද සිහි දෙක මැ පිරිසුදු වැ ඇති සතර වැනි දැහැන ලැබ වෙසෙන්නේ, මහණෙනී, මෙයට හරි සමාදිය කියන්නේ.

1. ප්‍රධන් වීර්යය

2. සම්‍යග් ආජීවය (සම්මා ආජීවය)

3. ආර්ය ශ්‍රාවකයා

මහණෙනි දුක් නිරොද වෙතට යන මඟ සහිත අරී සස් මේ කියා කියන්නේ..

*සතර සිහිවටනැ*
*දහම් අනුදක්නාවේ*
*දුක් නිරොද වෙතට යන*
*මඟැති අරී සස් නිමි යි.*

**මහ සතර සිහිවටන් සුතුර එන**
**දහම් අනුදක්නාව නමැති වන**
**එ සිවු වන වග ද මේ නිමි වග යි.**

මහණෙනි, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ සත් වසක්, කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, සත් වසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ ස වසරක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, ස වසරෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ පස් වසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, පස් වසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ සිවු වසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, සිවු වසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ තුන් වසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, තුන් වසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ දෙ වසරක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ . එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, දෙ වසරෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ එක් වසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, එක් වසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ සත් මසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, සත් මසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ ස මසෙක කලක් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, ස මසෙකුත් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ පස් මසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, පස් මසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ සිවු මසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, සිවු මසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ තුන් මසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, තුන් මසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ දෙ මසෙක කලක් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, දෙ මසෙකුත් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ එක් මසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, එක් මසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ අඩ මසක් කල් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, අඩ මසෙක් තිබේ වා, කිසි කෙනෙක් මේ සතර සීවටන මෙ සේ සතියෙක කලක් වඩන්නෝ වෙත් ද ඔහු මෙ දෙ පෙලෙන් කැමැති වන එක්තරා පලයකට හෝ සපැමිණෙන්නෝ යැ. එ නම් අරහත් බවට හෝ කෙලෙස් ඉතිරි වී ඇතොත් නොදගැමි බවට හෝ සපැමිණෙන්නෝ යැ.

මහණෙනි, සතන් සිත් පිරිසුදුව සඳහා ද සෝ වලප ඉක්මවනු සඳහා ද නය මඟට පැමිණීම සඳහා ද මොක් පසක් කොටගැනුම සඳහා ද එක් ම එක් මඟෙක් වෙයි, සතර සීවටන් නම් යැ යි බසෙක් කියන ලද නම් ඒ මෙ සඳහා කියා ලද්දේ මැ වෙයි.

බගවත්හු මෙ දෙසූ හ. තුටු සිතැති එ සඟ ගණ බගවතුන් ගේ බසින් අබිනඳන පත් වූ හ.

**කයනු'ව, සිතනු'ව**
**විඳුමනු'ව ද දහමනු'ව**
**විදක්නා සෙ දක්වූ**
**සිවු සිහිවටන නිමියේ**

| | |
|---|---|
| උතුරුකුරු | දිවයින |
| යක් හෙළ වගට එ | බසින |
| වදහළ සිරි | මුවින |
| රහත් පද සතියෙනුදු | ලැබෙදෙන |
| සිහිවටන | බණවර |
| පෙළ බසින් එත එ | ගැඹර |
| හෙළ ගියෙනි | මනහර |
| නැවැත හෙළ හදවතට ළං | කැර |
| දෙ දහස් වසින් | බුදු |
| පන්සිය පනස් වැනි | බුදු |
| මඟුලට මෙ | **අහුබුදු** |
| පිදී මෙ පබඳ හදින් | පිරිසුදු |


දින එකක් දෙකක් හෝ ගෙවී ගිය ඉදිමී
නිල්වන් වැ ගිය සැරව පිරි කයක්..


කවුඩුවන්..උකුස්සන්..ගිජු
ළිහිණියන්... බලු සිවල්
විවිද සත් පණුවනුදු විසින්
හෝ කනු ලබන කයක්....


තව ම ලේ මස් සහිත,
නහර වැල් බැඳී ගිය
අමු සොහොනැ දමා
ලූ කයක්.....


මසින් තොර ලෙයින් වැකි නහර වැල් බැඳී ගිය
ඇටසැකිල්ලක්වැ සොහොනෙහි දමා පියන ලද කයක්....


මසින් තොර, ලෙයින් තොර, බැඳුණු
ඒ නහර වැලින් ඇට සැකිල්ලක් වැ
ගිය අමු සොහොනැ ද මාලූ...


සියලු අතැ විසිරී ගිය ඇට
ගොඩක් වූ කයක්....


හක් පැහැය ඇති සුදු වැ ගිය ඇට ගොඩක් වූ කයක්....


තැනින් තැන ගොඩ ගැසුණු ඇට ගොඩක් වූ කයක්....


කුණු වැ ගිය සුනු වැ ගිය ඇට සුනු ම රැසක් වූ කයක්..